# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/11 - 2024 ජනවාරි මස 09 වැනි අඟහරුවාදා - 2024.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පළමුවන සංශෝධනය

ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවා ව්‍යවස්ථාව

2016 දෙසැම්බර් 06 දිනැති හා අංක 1996/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2024 ජනවාරි මස 01 වැනි දින.

| *අනු අංකය* | *සංශෝධනය* |
|---|---|
| 7.2.4.1 | වගුවට පහළින් දක්වා ඇති "ලිඛිත විභාගයට අදාළ විෂය නිර්දේශය හා විස්තර "අ" පරිශිෂ්ටයේ දක්වා ඇත." යන යෙදුම "ලිඛිත විභාගයට අදාළ විෂය නිර්දේශය හා විභාගය පවත්වනු ලබන ආකාරය සම්බන්ධව වන විස්තර "අ" පරිශිෂ්ටයේ දක්වා ඇත." ලෙස සංශෝධනය කරනු ලැබේ. |
| 7.2.4.3. | මේ යටතේ ඇති සටහනෙහි අංක 1 පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.<br>1. ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර හතටම (07) පෙනී සිට, 300කට නොඅඩු අවම මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස්ගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. |
| "අ" පරිශිෂ්ටය 1 කොටසෙහි "ආ" කොටසේ | සම්මුඛ පරීක්ෂණය යටතේ ඇතුළත් සටහන ඉවත් කර "අ" පරිශිෂ්ටයේ (1) විභාග පටිපාටිය "අ" කොටස යටතේ ඇති වගුවට පහළින් පහත සටහන ඇතුළත් කරනු ලැබේ.<br>සටහන<br>I. සියලුම අයදුම්කරුවන් සඳහා පළමුව බහුවරණ ප්‍රශ්න පත්‍රය පමණක් පවත්වනු ලැබේ.<br>II. බහුවරණ ප්‍රශ්න පත්‍රය සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය ලබා ඇති අයදුම්කරුවන් සඳහා පමණක් ඉතිරි විෂයයන්ට අදාළ විභාගය පවත්වනු ලැබේ. |

EOG 01 - 0075


1A - G 41217 — 07 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*